L6

00045

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
කළමනාකරණ අධ්‍යයන උපාධි පාඨමාලාව – සිව්වන මට්ටම
අවසාන පරීක්ෂණය - 2009
සාර්ව ආර්ථික විද්‍යාව - MCU 2207

කාලය : පැය තුනයි

දිනය : 2009.12.20 වේලාව: පෙ. ව. 9.30 - ප ව. 12.30

ඔනෑම ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.
වැඩ සටහන් සම්පාදනය කල නොහැකි ගණක යන්ත්‍ර භාවිතා කළ හැකිය.

1. (අ) ප්‍රධාන සාර්ව ආර්ථික ඉලක්කයන් මොනවාද? කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ආ) "සාර්ව ආර්ථික විචල්‍යයන් සහ ඒවායේ වෙනස්වීම පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගැනීම, ව්‍යාපාර කළමනාකරුවකුට ඔහුගේ ව්‍යාපාර පරිසරය ගැන පැහැදිලි දැක්මක් ලබා ගැනීමට සහ කාර්යක්ෂමව තීරණ ගැනීමට ඉවහල් වේ." ඔබ එකඟ වන්නේද? උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 14)

2. (අ) ජාතික ආදායම ගණනය කිරීම සඳහා ක්‍රමවේදයන් තුනක් ඇත. ඒවා කවරේද? කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(ආ) අංශ තුනක ආර්ථිකයක් පිළිබඳ තොරතුරු පහත දී ඇත.
(සියළුම අගයන් රුපියල් බිලියනවලින්)

$C = 40 + 0.8y$ (පරිභෝජනය)
$\overline{I} = 50$ (ආයෝජනය)
$\overline{G} = 60$ (රාජ්‍ය වියදම්)

(i) ජාතික ආදායම ගණනය කරන්න. (ලකුණු 02)
(ii) රජය විසින් ස්වායත්ත බදු වශයෙන් රු. බිලියන 10 ක් ($\overline{T} = 10$) අය කරන්නේ නම්, නව ජාතික ආදායම කුමක්ද? (ලකුණු 03)
(iii) ඉහත ස්වායත්ත බද්දට අමතරව, 10% ආදායම් බද්දක් රජය විසින් හඳුන්වා දෙන්නේ නම්, නව ජාතික ආදායම කුමක්ද? (ලකුණු 03)
(iv) වියදම් ගුණකය ගණනය කරන්න. (ලකුණු 02)
(v) රජය ආර්ථිකය විවෘත කර පහත සඳහන් වෙනස්වීම් සිදුවේ යයි උපකල්පනය කරන්න.

$M = 20 + 0.1y$ (ආනයන)
$\overline{X} = 60$ (අපනයන)

නව ජාතික ආදායම ගණනය කරන්න. (ලකුණු 04)

3. (අ) රූප සටහන් භාවිතයෙන් පහත සඳහන් ප්‍රකාශනයන් සත්‍යද, අසත්‍යද යන්න පැහැදිලි කරන්න.
(i) ද්‍රවශීලතා උගුල යටතේ මූල්‍ය ප්‍රතිපත්ති ඉහළ සාර්ථකත්වයක් දක්වන අතර පිස්කල් ප්‍රතිපත්ති සම්පූර්ණයෙන් අසාර්ථක වෙයි.
(ii) මුදල් සඳහා ඉල්ලුම පොලී අනුපාතය මත කෙසේවත් රඳා පවතින්නේ නැති විට, පිස්කල් ප්‍රතිපත්ති ඉහල සාර්ථකත්වයක් පෙන්වන අතර මූල්‍ය ප්‍රතිපත්ති සම්පූර්ණයෙන් අසාර්ථක වේ. (ලකුණු 10)

(ආ) අර්ධ තෙරපුම් ප්‍රතිවිපාකය යනු කුමක්ද? රූප සටහන් භාවිතයෙන් විස්තර කරන්න. ( ලකුණු 05 )

(ඇ) රූප සටහන් භාවිතයෙන් පහත දී ඇති තත්වයන් යටතේ ආදායම සහ පොලී අනුපාතය වෙනස් වන ආකාරය විස්තර කරන්න.
(i) ආර්ථිකයේ සාමාන්‍ය මිල මට්ටම ඉහළ යෑම .
(ii) මහ බැංකුව විසින් වෙළඳපල පොලී අනුපාතයන් පහත හෙලීම
( ලකුණු 05 )

4. (අ) පහත දෑ පැහැදිලි කරන්න.
(i) ඉල්ලුමෙන් ඇදුනු උද්ධමනය
(ii) පිරිවැයෙන් තල්ලු වූ උද්ධමනය ( ලකුණු 06 )

"සැබෑ උද්ධමන ක්‍රියාවලියක් තුල ඉල්ලුමෙන් ඇදුනු සහ පිරිවැයෙන් තල්ලු වූ උද්ධමන තත්වයන් දෙකෙහි කොටස් අන්තර්ගත වේ." ඔබ එකඟ වේද? මෙය ශ්‍රී ලංකාවේ පසු ගිය මාස දොළහ තුල උද්ධමනකාරී උපතතිය සම්බන්ධ කර පැහැදිලි කරන්න. ( ලකුණු 14 )

5. (අ) ව්‍යාපාර චක්‍රයේ අවස්ථාවන් කවරේද? කෙටියෙන් පැහැදිලි කරන්න. ( ලකුණු 05 )

(ආ) ව්‍යාපාර චක්‍රය සම්බන්ධයෙන් කේන්සියානු න්‍යාය පැහැදිලි කරන්න. ( ලකුණු 05 )

(ඇ) ආර්ථිකයක චක්‍රාකාර උස් - පහත් වීම් පාලනය කිරීම සඳහා මූල්‍ය සහ පිස්කල් ප්‍රතිපත්තින් භාවිතා කරන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න. ( ලකුණු 10 )

6. (අ) පහත දෑ අර්ථ කථනය කරන්න.
(i) ශ්‍රම බලකායේ සහභාගිත්ව අනුපාතය
(ii) ස්වාභාවික සේවා වියුක්ති අනුපාතය ( ලකුණු 06 )

(ආ) නිල සේවා වියුක්ති අනුපාතයන් සත්‍ය සේවා වියුක්ති මට්ටම ගණනය කිරීමට අපොහොසත් වෙන්නේ ඇයි දැයි පැහැදිලි කරන්න. ( ලකුණු 08 )

(ඇ) ව්‍යුහාත්මක හා පෙළඹ වූ (Induced) විරැකියා මට්ටම පහත හෙලීම සඳහා ගත හැකි පියවරවල් පැහැදිලි කරන්න. ( ලකුණු 06 )

7. (අ) මුදල් සැපයුම සහ මිල මට්ටම සම්බන්ධයෙන් කේන්සියානු පිවිසුම සහ සම්භාව්‍ය පිවිසුම අතර ඇති ප්‍රධාන වෙනස කවරේද? රූප සටහන් භාවිතයෙන් පැහැදිලි කරන්න. ( ලකුණු 10 )

(ආ) ආර්ථිකය සත්‍ය නිෂ්පාදන මට්ටම, එහි පූර්ණ සේවා නියුක්ති අවස්ථාවේ නිෂ්පාදන මට්ටම වන බිලියන 1000 ට වඩා, බිලියන 200 කින් අඩුය.
(i) රාජ්‍ය වියදම් වෙනස් කිරීම් තුලින් සහ
(ii) බදු වෙනස් කිරීම තුලින්

ආර්ථිකය පූර්ණ සේවා නියුක්ති මට්ටම ගෙන එන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න.
[ ආන්තික පරිභෝජන හැකියාව (MPC) = 0.8 ]
ඉහත පිවිසුම් දෙකේ වාසි සහ අවාසි කවරේද? ( ලකුණු 10 )

- හිමිකම් ඇවිරිණි -

**THE OPEN UNIVERSITY OF SRI LANKA**
**BACHELOR OF MANAGEMENT STUDIES**
**DEGREE PROGRAMME**
**LEVEL 04**
**FINAL EXAMINATION -2009**
**MACRO ECONOMICS – MCU 2207**
**DURATION: THREE (03) HOURS**

THE OPEN UNIVERSITY OF SRI LANKA LIBRARY

**DATE: 20.12.2009** **TIME: 9.30 a.m -12.30 p.m**

**INSTRUCTIONS**

- **Answer any five (5) questions only.**
- **All questions carry equal marks.**
- **Non programmable calculators are allowed to use.**

(1) (a) What are the major Macro Economic goals? Briefly explain. (6 Marks)

(b) "A proper understanding of Macro economic variables and their changes can give a business management, a better vision of understanding his business environment and it helps them to make effective decisions". Do you agree? Explain with examples. (14 Marks)

(2) (a) There are three methods in measuring National Income. What are they? Explain briefly. (6 Marks)

(b) Details of a three sector economy given as;
(Figures in Billion rupees)
$C = 40 + 0.8Y$ (Consumption)
$\overline{I} = 50$ (Investments)
$\overline{G} = 60$ (Government Expenditure)

i) Find the National Income. (2 Marks)

ii) Suppose government introduces an autonomous tax of 10 billion ($\overline{T} = 10$), Find the new National Income. (3 Marks)

iii) In addition to the autonomous tax, if government introduces an income tax of 10 %, find the National Income. (3 Marks)

iv) Find the Expenditure Multiplier. (2 marks)

v) Suppose the government opens up the economy and following changes take place.

$M = 20 + 0.1\ Y$ (Imports)
$\overline{X} = 60$ (Exports)

Find the new National Income (4 Marks)

(3) (a) Using illustrations, explain whether the following statements are true or false.

(i) Under Liquidity Trap, monetary policies are highly effective and fiscal policies are completely ineffective.

(ii) When demand for money does not depend on interest rate at all, fiscal policies are highly effective and monetary policies are completely ineffective. (10 Marks)

(b) What is Partial Crowding Out effect? Explain using illustrations. (5 Marks)

00045



THE OPEN UNIVERSITY OF SRI LANKA LIBRARY

(c) Using illustrations, explain how the income and interest rate change under following given conditions.

(i) Average price level in the economy increases.
(ii) Central Bank reduces the market interest rate. (5 Marks)

(4) (a) Explain the following
(i) Demand - pull inflation
(ii) Cost- push inflation (6 Marks)

(b) "The actual inflationary process contains some elements of both Demand- Pull and Cost- Push forces". Do you agree?
Explain this in relation to the inflationary trends in Sri Lanka for the last twelve months. (14 Marks)

(5) (a) What are the phases of a Business Cycle? Briefly explain. (5 Marks)
(b) Explain the Keynes theory of business cycle (5 Marks)
(c) Explain how the monetary and fiscal policies can be used to control cyclical fluctuations in the economy. (10 Marks)

(6) (a) Define the following.
(i) Labour Force Participation rate
(ii) Natural Rate of Unemployment (6 Marks)

(b) Explain why the official unemployment rate fails to measure the true level of unemployment. (8 Marks)
(c) Explain the steps that can be taken to reduce the level of Structural and Induced unemployment. (6 Marks)

(7) (a) What is the major difference of the Keynesian approach from the Classical approach on the money supply and the price level? Explain using illustrations. (10 Marks)

(b) An actual level of output in an economy is 200 billion less than the full employment level of output which is 1000 billion. Explain how the government can bring the economy to full employment level through;

(i) Changes in government expenditures and
(ii) Changes in taxes.
[Marginal propensity to consumer (MPC) = 0.8]
What are the advantages and disadvantages of these two approaches? (10 Marks)

- Copyright Reserved-